# පැරණි ධාතු කරඬු නිර්මාණ තාක්‍ෂණය

එන්. ටී. එස්. තිලකරත්න[1]

## හැඳින්වීම

බුදුදහමේ ආභාසයත් සමග ශ්‍රී ලංකාව තුළ සංස්කෘතික වශයෙන් විශාල ප්‍රබෝධයක් ඇති වූ අතරදාගැබ් ඉදි වීමත් ඒ තුළ බුදුන් වහන්සේගේ ධාතුන් සහිත කරඬු තැන්පත් කිරීමත් සුවිශේෂී කටයුත්තක් වී තිබේ. බෞද්ධාගමික වශයෙන් පූජනීය වස්තුවක් ලෙස සැලකිය හැකි ධාතුන් වහන්සේලා තැන්පත් කළ කරඬුවල නිර්මාණ තාක්‍ෂණය පිළිබඳව අධ්‍යයනය කිරීම අධ්‍යයනයේමූලික අරමුණ වේ. කරඬු, විවිධ ප්‍රමාණයන් හා හැඩයන්ගෙන් යුක්තව නිර්මාණය කර ඇති අතර ඒවා නිර්මාණය කිරීමේ දී භාවිත අමුද්‍රව්‍ය, තාක්‍ෂණික ක්‍රමවේද, අලංකරණය මෙන් ම කරඬුවලින් හෙළිවන වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පිළිබඳව ද මෙහි දී අවධානය යොමු කරනු ලබයි.

## ක්‍රමවේදය

සාහිත්‍ය මූලාශ්‍රයයන්ගේ සහ ක්‍ෂේත්‍ර සමීක්‍ෂණයෙන්කරුණු ගොනු කෙරිනි. ඓතිහාසික මූලාශ්‍රය මෙන් ම නූතන සියවස්හි ප්‍රකාශයට පත් වූ ප්‍රකාශන හා අන්තර්ජාලය පරිශීලනය සහ පුරා පරිශ්‍ර ආශ්‍රිතව හමුවී තිබෙන කරඬු කෞතුකාගාර නිරීක්‍ෂණය යටතේ අධ්‍යයනය කිරීමත් හඳුනාගත් දත්ත ඡායාරූපගත කිරීමත් සිදුවිය.

## අන්තර්ගතය

මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගමික ස්ථාන තුළ ස්තූප ඉදි වීමත් ධාතු, පූජනීය වස්තූන් තැන්පත් කිරීමත් සිදු විය. එසේ ධාතු තැන්පත් කිරීමේදී කරඬු භාවිත කිරීම ප්‍රධාන වශයෙන් සිදු වූ අතර කරඬු නිර්මාණය කිරීමේ දී විවිධ තාක්‍ෂණික ක්‍රමවේද ද භාවිත වූ ආකාරය හඳුනාගත හැකිය. කරඬු සැකසීම සඳහා තාක්‍ෂණ කිහිපයක් ලංකාව තුළ භාවිත කළ බවට සාධක හඳුනාගත හැකිය. එනම්,

- මැටි තාක්‍ෂණය
- ශිලා තාක්‍ෂණය
- ලෝහ තාක්‍ෂණය
- වීදුරු තාක්‍ෂණය

[1] තාවකාලික නිබන්ධන සහායක, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, thusharisandya1990@gmail.com

ධාතු කරඬු නිර්මාණය කිරීමේ දී පියවර කිහිපයක් අනුගමනය කරයි. පළමුව ධාතු කරඬු තැන්පත් කිරීම සඳහා මංජුසා නිර්මාණය කිරීම සිදු කරයි. මේ සඳහා බොහෝ විට මැටි, පාෂාණ වැනි ද්‍රව්‍ය යොදා ගනී. ඉන් පසු ප්‍රධාන ධාතු කරඬුව නිර්මාණය කිරීම දැකිය හැකිය. ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම සඳහා කරඬු නිර්මාණයේ දී එක් ධාතූන් වහන්සේ නමක් තැන්පත් කිරීම සඳහා ධාතු කරඬු කිහිපයක් නිර්මාණය කිරීම දැකිය හැකිය. එහිදී වටිනාකමෙන් අඩු මාධ්‍යයකින් විශාල කරඬුවක් නිර්මාණය කර ඒ තුළට ඇතුළත් කළ හැකි පරිදි වටිනාකමෙන් වැඩි ද්‍රව්‍යයකින් කුඩා කරඬුවක් නිර්මාණය කර ඒ තුළ ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම සිදු කර තිබෙන අකාරය හඳුනාගත හැකිය.

මැටි මාධ්‍ය බහුලව කරඬු නිර්මාණය කිරීම සඳහා යොදාගෙන තිබේ. මිහින්තලේ කඳු මුදුනේ දාගැබ කැණීම් සිදු කළ පරණවිතානයන්ට ඔප දැමූ කළු මැටියෙන් කළ කරඬුවක් හමු වී ඇති අතර ලංකාවේ මෙතෙක් සිදු කළ පර්යේෂණවලින් සොයාගෙන තිබෙන වටිනාම මැටි කරඬුව මෙය ලෙස සැලකේ. අඟල් □ÆÐ ක් උසකින් ද අඟල් □DÐ ක් විශ්කම්භයකින් ද මෙම කරඬුව යුක්ත වේ. එහි පියන් කොටස හා හෙප්පු කොටස වශයෙන් කොටස් දෙකකි. ඒ තුළ රන් කරඬු තැන්පත් කර තිබිණි. (පරණවිතාන, 2001: 82) 1996 දී අභයගිරි ස්තූපයේ බටහිර ආයකයේ තිබී මෙවැනිම මැටි කරඬුවක් හමු විය. එය රක්ත වර්ණ සියුම් මැටියෙන් නිමවා තිබිණි. මැටි කරඬුවේ පියන ස්තූප හැඩයක් ගන්නා ලදී. සෙ. මී. 19 ක් උසකින් හා සෙ. මී. 14 ක් පළලකින් යුක්ත කරඬුව තුළ වීදුරු කරඬුවක් හා ඒ තුළ පළිඟු කරඬුවක් ද, පළිඟු කරඬුව තුළ ධාතූන් වහන්සේලා ද තැන්පත් කර තිබේ. (කුලතුංග, 1997: 23) ඒ අනුව අතීත ශිල්පීන් කරඬු නිර්මාණය කිරීමත් මැටි පදම් කිරීමේ තාක්‍ෂණය, ඔප දැමීමේ කාර්ය, හැඩගැන්වීම ආදී කටයුතු සිදු කිරීමට මනා නිපුනතාවයක් දැක් වූ බව සඳහන් කළ හැකිය.

කරඬු නිර්මාණයේදී ශිලා තාක්ෂණය (පාෂාණ තාක්ෂණය) ද බහුලව භාවිත කර ඇත. ග්‍රැනයිට්, නයිස් ආදී පාෂාණ විශාල කරඬු නිර්මාණයට හා ධාතු මංජුසා නිර්මාණයට යොදා ගත් අතර පළිඟු, තිරුවානා, මැණික් වර්ග ආදිය කුඩා ධාතු කරඬු නිර්මාණයට හා අලංකරණයට යොදාගෙන ඇත. මීට අමතරව හුණු ගල් ද ධාතු කරඬු නිර්මාණය සඳහා ශිල්පීන් යොදාගෙන තිබේ. ගැනයිට්, නයිස්වලින් නිපදවූ ධාතු කරඬු ලංකාවේ අභයගිරිය, ජේතවනය, තන්තිරිමලය ආදී බොහෝ ස්ථාන ආශ්‍රිතව හමු වී තිබේ. තිරුවානා හා පළිඟුවලින් කළ කරඬු යටාල දාගැබ ඇතුළු තවත් ස්ථාන රැසක් ආශ්‍රිතව හමුවිය. (පාකර්, 2008: 401) මේවා ඉතා සියුම්ව කපා ඔපමට්ටම් කර තිබූ අතර ධාතූන් තැන්පත් කිරීම සඳහා කරඬුව මධ්‍ය දක්වා සිදුරු කර තිබේ. ස්තූපයක් ආකාරයටම කරඬුව නිර්මාණය කිරීමට උත්සාහ

කර ඇති අතර ඔප දැමීම සඳහා ලියවන පට්ටලය භාවිත කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. සුලභව පැවතීමත් පහසුවෙන් සපයා ගැනීමට හැකිවීමත් නිසා ධාතු කරඬු නිර්මාණයට වැඩි වශයෙන් පාෂාණ යොදාගෙන තිබෙන බව සිතිය හැකිය.

ලෝහ තාක්ෂණය ධාතු කරඬු නිර්මාණය සඳහා බහුල වශයෙන් රන්, තඹ, ලෝකඩ යොදාගැනීම වැදගත් වේ. ධාතු කරඬු නිර්මාණයට ලෝහ ආකාර කිහිපයකට භාවිත කර තිබේ.

- වාත්තු කිරීම
- ලෝහ තුනියට තලා එකතු කිරීම
- කොටස් වෙන වෙනම නිර්මාණය කර ඒවා එකට එකතු කර කරඬු නිර්මාණය

එහිදී පේසා වළලු, ගර්භය, හර්මිකාව, යෂ්ටිය, ඡත්‍ර, කොත ආදී සෑම අංගයක් කෙරෙහිම වැඩි අවධානය යොමු කරනු ලැබේ. (උදා: දීඝවාපියෙන් හමු වූ රන් කරඬුව, දැදිගම කොටවෙහෙරෙන් හමු වූ කරඬු) නීලගිරි දාගැබ ආශ්‍රිතව හමුවන රන් කරඬුවල ද කැටයම්, අලංකාර ආදිය පැහැදිලිවම හඳුනාගත හැකිය. ලෝහ නම්‍යශීලී ද්‍රව්‍යයක් ලෙස පරිවර්තනය කර ගැනීමට එකල ශිල්පීයා සමත් වී තිබේ.

වීදුරු තාක්ෂණය ද ධාතු කරඬු නිර්මාණය සඳහා භාවිත කරතිබේ. 1996 දී අභයගිරි බටහිර ආයකයෙන් හමු වූ වීදුරු කරඬුවේ පාදම ලෙස මැටි කවයක් යොදා ඇති අතරජ් මත වීදුරුවලින් කළ පේසා වළලු තුනත් තනි වීදුරු ගර්භයත් ස්තූපයක හැඩයටම නිර්මාණය කර තිබේ. හර්මිකාව, ඡත්‍රාවලිය ආදියත් වීදුරුවලින්ම සකසා එකම කරඬුවක් ලෙස සකසා තිබේ. මෙම අංග එකිනෙකට සම්බන්ධ කිරීම සඳහා යම් ගම් වර්ගයක් භාවිත කර තිබිණි. කරඬුව සෙ. මී. 16 ක් පමණ උසකින් ද විශ්කම්භය සෙ. මී. 6.5 ක්ද විය. (කුලතුංග, 1997: 23) ධාතුන් තැන්පත් කිරීම සඳහා ලී කරඬු, ඇත්දත් ආදී අස්ථි කැබලිවලින් ද ධාතු කරඬු නිර්මාණය කරන්නට ඇතැයි සිතිය හැකිය. නමුත් ලී ආදිය ස්වාභාවික ක්‍රියා නිසා දිරාපත් වන්නට ඇත. එබැවින් ඒ පිළිබඳ නිශ්චිත සාධක අනාවරණය කර ගැනීමට නොහැකිය. කුඩා, මධ්‍යම හා විශාල වශයෙන්ධාතු කරඬු ප්‍රධාන කොටස් තුනක් යටතේ හඳුනාගත හැකිය. කරඬුවල ඝනකම, හැඩතල, කැටයම් ආදිය කරඬු නිර්මාණය කරනු ලබන මාධ්‍ය අනුව එකිනෙකට වෙනස් වේ. කරඬුවල ආකෘතියට කාලීනව යම් යම් එකතුවීම්, වෙනස්වීම් සිදු වී තිබේ.විවිධ වර්ගයේ මැණික් ගල්, විටිනා ඛනිජ කරඬුවල වටිනාකම සහ අලංකාරය වැඩි කිරීමට යොදා ගෙන තිබේ. කරඬු නිර්මාණය කිරීම බොහෝ විට දාගැබ් ආශ්‍රිතවම සිදු වූ බව කිව යුතුය. අභයගිරිය, නීලගිරිය, ජේතවන ස්තූප ආශ්‍රිතව ධාතු කරඬු නිර්මාණයට යොදාගත් අමුද්‍රව්‍යවල ඉවතලු කොටස් හඳුනාගෙන තිබේ.

කරඬුවලින් සුවිශේෂ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කරනු ලබයි. මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර ආදී ග්‍රන්ථවලඇති ස්තූපයන්හි හැඩතල, ආකෘතිය ආදිය ඒ ආකාරයෙන්ම යොදාගෙන නිර්මාණය කරන ලද ධාතු කරඬු හමු වී තිබේ. ස්තූපයක හැඩය අනුව ධාතු කරඬු තැනූ නිසා ඒවා දාගැබ්වල ආදර්ශයන් ලෙස පරණවිතාන සලකන ලදී. (පරණවිතාන, 2001: 23) නිදසුන් ලෙස 1883 දී තිස්සමහාරාමයේ යටාල දාගැබ ප්‍රකෘර්තිමත් කිරිමේදී ධාතු කරඬු කිහිපයක් හමු විය. එහි එක් කරඬුවක් ක්‍රිසොබෙරිල් නම්ගල් වර්ගයකින් නිමවා තිබිණි. එය සටාකාර හැඩයෙන් යුක්ත විය. මේ කරඬුවට සමාන තවත් කරඬුවක් වයඹ පළාතේ නිකවැකන්ද නම් ස්ථානයෙන් ද සොයාගෙන තිබේ. ඒ තුළින් ස්තූපයේ හැඩය කෙසේ පැවතියා ද යන්න පිළිබඳ ආබෝධ කරගත හැකිය. පරණවිතානයන් පවසනුයේ ලක්දිව තුළ පද්ම, ආම්ලාකාර හැඩයෙන් යුක්ත ස්තූපවල ලක්ෂණ ධාතු කරඬුවල නොදක්නා ලද බවයි. (පරණවිතාන, 2001: 23)

මිහින්තලා කඳු මුදුනේ දාගැබෙහි මැටි කරඬුවක් තුළ වූ රන් කරඬු දෙක ඉන්දියාවේ සාංචි ස්තූපයේ නිර්මාණ ලක්ෂණ පෙන්නුම් කරයි. සාංචි ස්තූපයේ එක් පේසාවක් හා හතරැස් කොටුව මුදුනේ වූ ඡත්‍ර යෂ්ටිය හා එක් ඡත්‍රයකි (පරණවිතාන, 2001: 82). දැලිවල කොටවෙහෙරින් හමු වූ රන් කරඬුව තුළින් ද ස්තූප නිර්මාණ ලක්ෂණ හඳුනාගත හැකිය (Silva, 1998: 45). මෙහි තිබී පළිඟු හා වෙනත් පාෂාණවලින් නිම වූ කරඬු 178 ක් පමණ සොයාගෙන තිබේ. එහි දී හමු වූ රන් කරඬුවේ ස්තූපය වටා වූ වේදිය පැහැදිලිව දක්වා ඇත. යූපයේ එක් ඡත්‍රයක් පමණක් දක්නට ලැබේ. සතරැස් කොටුවේ සතර පැත්තෙන් විහිදෙන ධජ හතරක් ද දැකිය හැකිය.

රුවන්වැලිසෑය තුළින් හමු වූ ක්‍රි: පූ: පළමු සියවසට අයත් සේ සැලෙකෙන රන් කරඬුවේ සතරැස් කොටුව මුදුනේ යූපය හා සතර දිශාවට විහිදෙන කොඩි සතරක් දැකගත හැකිය. ඡත්‍ර දණ්ඩ මුදුනේ කුඩා කොත් කැරැල්ලක ස්වරූපයෙන් දක්වා ඇත්තේ ඡත්‍රාවලියයි. මීට සමානව තවත් කරඬුවක් අභයගිරි ස්තූප ආයක කැණිමෙන් හමු වී තිබේ. එහි වෙනසකට පැවතියේ රුවන්වැලිසෑ කරඬුවේ යූපය මහතින් වැඩිවීම පමණි. (කුලතුංග, 2004: 42-43) රනින් නිම කළ කරඬුවල බොහෝ විට ඡත්‍රාවලිය දක්වා ඇත්තේ ඡත්‍ර දණ්ඩ මත පිහිටි කුඩා කොත් කැරැල්ලක ස්වරූපයෙන් ඒකසර කේතුවක් මගින්ය. එය ඡත්‍රාවලියක නියමාකාර ස්වරූපය නොවේ. නමුත් අභයගිරියෙන් හමු වූ වීදුරු කරඬුව තුළින් ඡත්‍රාවලිය පැහැදිලිව හඳුනාගත හැකිය. එක් ඡත්‍ර දණ්ඩකට ඇතුල් කරන ලද ඡත්‍ර වෙන වෙනම හඳුනාගත හැකිය.

දේවතාකොටුව හා කොත්කැරැල්ල ඉදි වූ කාලය පිළිබඳව ඉතිහාසය පිරික්සීමේදී අදහස් රාශියක් ඉදිරිපත් වී තිබූ ආකාරය දැකගත හැකිය. ඡත්‍රාවලිය වෙනුවට කොත් කැරැල්ල ඉදිවීම පිළිබඳ පැහැදිලි පුරාවිද්‍යා සාක්ෂියක් 1980 දශකයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හමු වී තිබේ. දීඝවාපී ස්තූපයේ දකුණු

ආයකයෙන් සොයාගන්නා ලද රන් කරඬුවක පැහැදිලි ලෙසම දේවතා කොටුව හා කොත් කැරැල්ල හඳුනාගත හැකිය. (Silva, 1998: 48) පියවර කිහිපයක් යටතේස්තූපයේ වාස්තු විද්‍යාත්මක අංගවල විකාශනය සිදු වූ අතර එම ලක්‍ෂණ ධාතු කරඬු නිර්මාණයන් සඳහා ද මුසුව ඇති බව පැහැදිලි වේ.

**සාරාංශය**

ශ්‍රී ලංකාව තුළ බුදුදහමේ ප්‍රබෝධයක් ඇතිවීමත් සමග දාගැබ් ඉදි වීමත් ඒ තුළ සර්වඥ ධාතූන් සහිත කරඬු තැන්පත් කිරීමත් සිදු විය. කරඬු විවිධ ප්‍රමාණයන් හා හැඩයන්ගෙන් යුක්තව නිර්මාණය කර ඇති බවත් මැටි, ශිලා, ලෝහ, වීදුරු වැනි අමුද්‍රව්‍ය භාවිත කර විවිධ තාක්‍ෂණික ක්‍රමවේද ඔස්සේ අලංකරණය කළ බවත් පෙනෙයි. විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයෙන් කරඬු නිර්මාණය කර තිබෙන අතර කරඬුවලින් ස්තූප නිර්මාණය ආශ්‍රිත වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ ද පිළිබිඹු කරනු ලබයි. පැරණි කලා නිර්මාණ තාක්‍ෂණයත් බුදුදහමේ ස්පර්ශයත් එකට එක්වූ අපූර්ව පූජනීය සලකුණක් වශයෙන් කරඬුවල ඇති සුවිශේෂීත්වය ඇගයිය හැකි වේ.

ප්‍රමුඛ පද: කරඬු, තාක්‍ෂණය, ස්තූපය, බුදුදහම, ධාතු

**ආශ්‍රිත ග්‍රන්ථ**

කුලතුංග, ටී.ජී. (2004). *ලංකාවේ ස්තූපය,* මහරගම: තරංජි ප්‍රින්ට්ස්.

පරණවිතාන, සෙනරත්. (2001). *පුරාවිද්‍යා පර්යේෂණ,* බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශන.

මහාවංශය, බුද්ධදත්ත හිමි, පොල්වත්තෙ. (1959). (සංස්.) කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Silva, Roland. (2004). *Thupa Thpaghara and Thupa pasada*. (Memoirs of the Archaecture survey of Ceylon Volum x Part 2). Colombo: Department of Archaeology.

කුලතුංග, ටී. ජී. (1997). *සංස්කෘතික පුරාණය.* 2 වෙළුම 3 කලාපය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

කුරුනේරු, පර්සි, අභයගිරිය - "අභයගිරි පුදබිමේ ගඩොල් දෙකක් අතර වසර දෙදහසක් පැරණි පුරාවස්තු රන් මංජුසා ඇතුළේ තවත් රන් මංජුසා තුනක්". Available at:http://www.divaina.com/2012/07/12/news14.html.